# එ ජා ප - ශ්‍රී ල නි ප ගිවිසුම

පසුගිය සතියේ පුවත්පත්වල පළ වූ වාර්තා අනුව එ ජා පක්‍ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා නිල වශයෙන් ම තම පක්‍ෂය හා ශ්‍රී ල නි පක්‍ෂය අතර තිබූ අවබෝධතා ගිවිසුම අවලංගුකර ඇත. එයට පෙර පක්‍ෂයේ සභාපති රුක්මන් සේනානායක මහතා නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ ඉල්ලීමකට අනුව ඒ අවබෝධතා ගිවිසුම ප්‍රසිද්ධියේ ඉරා දැම්මේ ය. පසුගිය දිනෙක මේ තීරුවෙන් අප කියා සිටියේ මේ පක්‍ෂ දෙක අතර ඇති එකම අවබෝධතාව අනෙක් පක්‍ෂය පරයා යෑමට කටයුතු කිරීම බව ය. එමෙන් ම ඒ පක්‍ෂ දෙක අතර මෑත දී ඇතිකරගන්නා ලද ඊනියා අවබෝධතා ගිවිසුම බටහිරයන්ගේ අවශ්‍යතාවට ඇතිකරගන්නා ලද්දක් බව ද, එය ලියම් ෆොක්ස් ගිවිසුමේ ම දිගුවක් බව ද කීවෙමු. අප මේ කරුණු කීවේ ඒ ඇසින් දැක හෝ ඒ පිළිබඳ තොරතුරු දනෙගැනීමෙන්වත් හෝ නොව අප විසින් ගොඩනගන ලද දේශපාලන ප්‍රවාදවලට අනුකූලව ය.

අපේ ප්‍රවාද තහවුරුකරන පුවතක් පසුගිය දිනක දි අයිලන්ඩ් පුවත්පතෙහි සඳහන් විණි. ඒ අනුව ඇමරිකන් එක්සත් ජනපද රාජ්‍යය අවසන් මොහොත දක්වා ම ගිවිසුම බේරාගැනීමට උත්සාහ දරා ඇත. එසේ ඇමරිකන් එක්සත් ජනපද රාජ්‍යය උත්සාහගත් බව පවසා තිබුණේ මෙරට ඇමරිකන් තානාපතිවරයා ය. ඇමරිකන් තානාපතිවරයා එලෙස උත්සාහයක් ගෙන ඇත්තේ ඒ ගිවිසුම ඔස්සේ එරට බලාපොරොත්තුවන යම්කිසි ක්‍රියාවලියක් සිදුවීමට තිබුණු බැවිනි. මෙරට සිංහලත්වයට හිමි තැන අහිමිකිරීම හා දෙමළ ජාතිකත්වයට ඊනියා දෙමළ අසිලාෂ මුදුන්පත් කරගැනීමට උපකාරකිරීම බටහිරයන්ගේ මූලික අවශ්‍යතාවකි.

ඇමරිකන් තානාපතිවරයාගේ උත්සාහය මධ්‍යයේ ද ඊනියා ගිවිසුම අහෝසිවීම ගැන අපි සතුටුවෙමු. ඒ පක්‍ෂ දෙක අතර බටහිරයන්ගේ අවශ්‍යතාවට ඇතිකරගන්නා ලද ගිවිසුම කෙසේවත් රටේ යහපත සඳහා නොවන බව අපි දනිමු. ආණ්ඩුවට එක්වූ එක්සත් ජාතික පක්‍ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනකු ම ෆෙඩරල්වාදීන් වීම ආණ්ඩුවේ ජාතික විජාතික බලවේගවල බල තුලනයෙහි යම්කිසි වෙනසක් සිදුකළ ද එ ජා ප - ශ්‍රී ල නි ප ඊනියා අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක වී නම් එයට වඩා බරපසළ හානියක් එමගින් රටට වීමට තිබුණි. එහෙත් එය වැළකී ගියේ සිංහලයන් අතළු සිටින ධනපතීන් යැයි කිවහැකි පිරිස ද, බටහිර ප්‍රජාතන්ත්‍රවාදී නියමවලට අනුකූලව පංති හැඟීමකින් ක්‍රියා නොකරන බැවිනි.

ආණ්ඩුව බලයට පත්කෙරුණේ ඒකීයවාදීන් විසින් වුව ද අද ආණ්ඩුවේ බලයේ සිටින්නේ ෆෙඩරල්වාදීන් ය යන්න අපට පුදුමයට කරුණක් නො වේ. රටේ මහජනතාවට, එනම් ඊනියා පරමාධිපත්‍යය හිමිවුවනට, බලය යම් පමණකින් හෝ ඇත්තේ මැතිවරණ කාලවල දී පමණ ය. අනෙක් කාලවල දී සාමාන්‍යයෙන් ආණ්ඩුව මෙහෙයවනු ලබන්නේ විජාතික බලවේග විසිනි. විජාතික බලවේග හා ජාතික බලවේග අතර බල අරගලය දිගින් දිගට ම පවතින එකකි. ඊනියා අවබෝධතා ගිවිසුම ඇතිවීම ම ජාතික බලවේගවල පරාජයක් විය. ගිවසුම අත්සන්කිරීමෙන් පසුව  එ ජා පාක්ෂික ආණ්ඩුවක් හෝ බොහෝ විට එ ජා ප ප්‍රමුඛ එ ජා ප - ශ්‍රී ල නි ප ආණ්ඩුවක් හෝ බිහිවීමේ ඉතා වැඩි ඉඩහඩක් තිබුණි. එසේ බිහි වී දෙමළ ජාතිවාදයේ ඊනියා අභිලාෂ මුදුන්පත්කරවන පණත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ සම්මත කරවාගැනීමේ අවදානම බෙහෙවින් තිබුණි. ඒ වැඩ පිළිවෙළ බටහිරයන්ගේ අනුග්‍රහය හා අධ්‍යක්‍ෂණය යටතේ ක්‍රියාත්මකවීමට තිබුවකි.

අද අප සතුටුවන්නේ  දෙමළ ජාතිවාදයට පක්‍ෂපාතී වූ ඒ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක නොවීම සමබන්ධයෙනි. අවබෝධතා ගිවිසුමක් ඇතිවීම විජාතික බලවේගවල ජයග්‍රහණයක් නම් ඒ ඉරාදැමීම ජාතික බලවේගවල ජයග්‍රහණයකි. ෆෙඩරල්වාදීන් ආණ්ඩුවට එකතුවීම තරමක පසුබෑමක් වුව ද අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මකවීම සමග සංසන්දනයකිරීමේදී ඒ එතරම් වැදගත් නො වෙයි. එහෙත් එයින් කියැවෙන්නේ ඒ නොසලකා හැරියහැකි බව නො වෙයි.

අවබෝධතා ගිවිසුමෙහි සිංහලත්වයට වූ තර්ජනය විදහා දැක්වෙන තවත් ප්‍රකාශයක් රනිල් වික්‍රමසිංහ මහතා අතින් පසුගිය සතියෙහි කෙරිණි. ඒ මහතා කියා සිටියේ අවබෝධතා ගිවිසුමට අනුව එ ජා පක්‍ෂය සර්වපාක්‍ෂික නියෝජිත

© Prof. Nalin De Silva

කමිටුවට සහභාගි වූ බවත් ඒ අනුව චොක්සි මහතා (ජී එල් පීරිස් මහතා ද සමගින්) එයට සහභාගිවීමට අමතරව තමා තිස්ස විතාරණ මහතා කිහිප අවස්ථාවක ම හමු වූ බවත් තිස්ස විතාරණ යෝජනාවලිය ඉදිරිපත්කිරීමේ දී එ ජා පක්ෂය එයට ආධාරකළ බවත් ය. මෙයින් පෙනී යන්නේ තිස්ස විතාරණ මහතා සර්වපාක්ෂික නියෝජිත කමිටුවට ඉදිරිපත්කළ යෝජනා විශාල වශයෙන් එ ජා පක්ෂයේ ද යෝජනා බව ය. මේ යෝජනා සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ සාකච්ඡා වූ කරුණු මත පදනම් වූවක් නොව ඊනියා විද්වත් මණ්ඩලයේ බහුතරයේ යෝජනා මත පදනම් වූ දෑ ය.

සමසමාජ පක්ෂය හා එ ජා පක්ෂය පමණක් නොව මාක්ස්වාදී යැයි කියාගන්නා අනෙක් බොහෝ පක්ෂ ද, ඊනියා පශ්චාත් මාක්ස්වාදීන් ද, පශ්චාත්නූතනවාදීන් ද, මංගල සමරවීර රුවන් ෆර්ඩිනන්ඩ්ස් හවුල ඔස්සේ පුවත්පත්වල ඉඩකඩ ලබාගන්නා වෙනත් එවැන්නන් ද, රාජ්‍ය නොවන සංවිධානවල කුලියට වැඩකරන්නන් ද, ආදී එකී මෙකී නොකී පිරිස් එකට එකතුකර ඔවුන් සිංහලත්වයට එරෙහි වුවන් බව කාහටත් පෙනෙන්නට  සැලැස්වීම පසුගිය කාලයේ මෙරට දේශපාලනයේ සිදු වූ වැදගත් සිද්ධියකි. ඔවුන් හෙළිදරවු වීම ද ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය මත ම පදනම් වීම දෛවයේ සරදමකි. මේ පිරිස් එකිනෙකාට සතුරු යැයි කීව ද මෙරට දොශපාලනයේ ප්‍රධාන ම ප්‍රශ්නයේ දී එක් පිළක සිටින්නේ ඔවුන් විජාතික බලවේගවල නියෝජිතයන් බව තහවුරුකරමින් ය. එ ජා පක්ෂය හා ශ්‍රී ල නි පක්ෂය අතර ඇති වූ ඊනියා අවබෝධතා ගිවිසුමට මොවුහු සියල්ලෝම පාහේ සහාය දුන්හ. එමෙන් ම රූපවාහිනියෙන් හා වෙනත් ජනමාධ්‍යවලින් අප හමුවට එන බොහෝ විද්වත්තු හා ඇතැම් භික්ෂූන් වහන්සේ ද ඊනියා අවබෝධතා ගිවිසුමෙහි ගුණ වර්ණනාකළහ. අද ඒ පිරිස් අවබෝධතා ගිවිසුම අහෝසිවීම පිළිබඳ ව කියන්නේ කුමක් දැයි දැනගැනීමට නොහැකි වීම විද්වතුන් හෝ ප්‍රබුද්ධයන් හෝ නොවන අපේ අභාග්‍යයක් ම විය යුතු ය.

ඊනියා එ ජා ප - ශ්‍රී ල නි ප අවබෝධතා ගිවිසුම අහෝසිකිරීම ජාතිකවාදීන්ගේ ජයග්‍රහණයක් වුවත් අපට එයින් සෑහීමකට පත්විය නො හැකි ය. ආණ්ඩුවේ වගකීම වනුයේ එහි අළුත් හෝ පරණ හෝ මැති ඇමතිවරුන්ගේ පෞද්ගලික ප්‍රතිපත්ති පැත්තකට දමා ජනතාව විසින් ජයග්‍රහණය කරවන ලද මහින්ද චින්තන ක්‍රියාත්මක කරවීම ය, මැති ඇමතිවරු තාවකාලික වෙති. එහෙත් ඒකීය රාජ්‍යයට එයට වඩා ස්ථිර වෙයි. මෙරට අවුරුදු දහස් ගණනක් පැවති එක්සේසත් රාජ්‍යය (ඒකීය රාජ්‍යයක් යනු පරිපාලනය ද මධ්‍යගත වූ රාජ්‍යයකි.) නැතිකර සන්ධීය රාජ්‍යයක් ඇතිකිරීමට ෆෙඩරල්වාදීන්ට ඉඩදිය හැකි නොවේ.

ආණ්ඩුවට එකතු වූ ජී එල් පිරිස් ඇමතිවරයා කියා තිබුණේ ඒකීය ෆෙඩරල් ආදී වචනවලට නිසි අර්ථකථන දිය නොහැකි බවත් අප වචනවල සිරකරුවන් නොවිය යුතු බවත් ය. පීරිස් මහතා දන්නා එකම දෙය ද වචන ය. එහෙත් ඒ වචනවලට තේරුම් ඇති බව ඔහු නො දනියි. ඒකීය රාජ්‍යයක වැදගත් ම ලක්ෂණය නම් පරිධියේ ඇති ආයතනවලට පැවරෙන බලය අවශ්‍ය වූ විටක මධ්‍යයට ආපසු ලබාගැනීමට ඇති හැකියාව ය. එක්සේසත් රාජ්‍යයෙහි එවැනි බලය පැවරීමක් හෝ නොවූ බව අමතක නොකළ යුතු ය. සන්ධීය රාජ්‍යයක එසේ පවරනු ලැබූ ඇතැම් බලතල ආපසු ලබාගත නො හැකි ය. සහසන්ධීය රාජ්‍යයක් යනු නාම මාත්‍රික මධ්‍යයකින් නාමික ව බැඳුණු වෙනම රාජ්‍යය දෙකකි.

මේ අතර පසුගිය දා සසංක පෙරේරා නම් සමාජ විද්‍යාඥයා ප්‍රකාශකර තිබුණේ පැරණි රාජ්‍යයෙහි රජුගේ බලය වර්ග සැතපුම් විසිපහකට හෝ පනහකට හෝ පමණ සීමාවූ බව ය. එකල රජවරුන්ගේ වපසරි ඒකකයක් ලෙස වර්ග සැතපුම් නොතිබූ බැවින් මේ විද්වතා එකල ඒකක වර්ග සැතපුම්වලින් ප්‍රකාශකරන්නේ කෙසේ දැයි දන්නවා විය යුතු ය. ඒ කෙසේ වෙතත් ඔහුට ඒ ප්‍රකාශයකිරීමට ඇති සාධක කවරේ ද? අනුරාධපුරයේ රජකල රජවරුන්ගේ සෙල්ලිපි දිවයිනේ සෑම ප්‍රදේශයක ම පාහේ හමු වී ඇත්තේ කෙසේ දැයි ඒ මහතා තේරුම්කරන්නේ කෙසේ ද?  වල්ලිපුරම් සන්නස ආදිය ගැන ඔහු කියන්නේ කුමක් ද? මේ උගතුන්ට ඇති ප්‍රශ්නය බටහිර දෘෂ්ටිකෝණයෙන් මිදෙන්නට ඔවුන්ට නො හැකිවීම ය. ඈපා මාපා ආදීන් රජු වෙනුවෙන් ඒ ඒ ප්‍රදේශවල පරිපාලනයෙහි යෙදනවුන් බව මේ විද්වතුන්ට නො තේරෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva